(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(7).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2026 සැප්තැම්බර් 25 සිකුරාදා

2026 ඔක්තෝබර් 06 අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව,— ව්‍යාපාර ධාරිතාව ඉහළ නැංවීම, මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කිරීම, තාක්ෂණයට අනුගතවීම ප්‍රවර්ධනය කිරීම සහ වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) අංශය ශක්තිමත් කිරීමේ අරමුණින් රජය විසින් 'ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' (මෙතැන් සිට 'SDP' ලෙස හඳුන්වනු ලැබේ) ආරම්භ කර ඇති හෙයින් ද;

සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම මඟින් කෘෂිකාර්මික හා කෘෂි ව්‍යාපාරික අංශ ශක්තිමත් කිරීමේ අරමුණින් රජය විසින් 'කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' (මෙතැන් සිට 'AVC' ලෙස හඳුන්වනු ලැබේ) ආරම්භ කර ඇති හෙයින් ද;

එකී 'SDP' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100) ප්‍රතිපත්ති පාදක ණයක් (Policy-Based Loan - PBL) සහ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100) මූල්‍ය අතරමැදි ණයක් (Financial Intermediation Loan - FIL) ද, එකී 'AVC' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන තිහක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 30) ප්‍රතිපත්ති පාදක ණයක් (PBL) සහ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන හැත්තෑවක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 70) මූල්‍ය අතරමැදි ණයක් (FIL) ද ඇතුළත් මූල්‍ය සහාය සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව (ADB) එකඟ වී ඇති හෙයින් ද;

'SDP' වැඩසටහනට අදාළ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100ක) ප්‍රමාණයකින් යුත් මූල්‍ය අතරමැදි ණය සංරචකය ද, 'AVC' වැඩසටහනට අදාළ ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන හැත්තෑවක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 70ක) ප්‍රමාණයකින් යුත් මූල්‍ය අතරමැදි ණය සංරචකය ද, අවශ්‍ය නිසි විමර්ශනයන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව හඳුනාගනු ලබන මූල්‍ය ආයතන හරහා සුදුසුකම් ලත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ණය වශයෙන් ලබා දීමට අපේක්ෂා කරන බැවින් ද, එම මූල්‍ය ආයතන එම අරමුදල් නිකුත් කිරීමේ දී මූල්‍ය අතරමැදියන් ලෙස කටයුතු කරනු ලබන හෙයින් ද;

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 20 වගන්තියේ (2) උපවගන්තිය ප්‍රකාරව, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් හෝ රාජ්‍ය ව්‍යවසායක් නොවන යම් ආයතනයක බැඳීම්වලට අදාළව අරමුදල් ණය වශයෙන් ලබා දීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වන හෙයින් ද;

ඊට අනුකූලව, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 20 වගන්තියේ (2) උපවගන්තිය ප්‍රකාරව, අවශ්‍ය නිසි විමර්ශනයන්ගෙන් අනතුරුව හඳුනාගනු ලැබ ඇති පහත සඳහන් මූල්‍ය ආයතන හරහා, 'ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' ('SDP') සහ 'කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' ('AVC') යන වැඩසටහන්වලට අදාළ මූල්‍ය අතරමැදි ණය සංරචක යටතේ වන අරමුදල් ණය වශයෙන් ලබා දිය යුතු බවටත්, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ සහ අනෙකුත් අදාළ ලිඛිත නීතිවල විධිවිධානවලට අනුකූලව, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට බලය පැවරිය යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

1. හැටන් නැෂනල් බැංකුව පීඑල්සී;
2. සෙලාන් බැංකුව පීඑල්සී;
3. සම්පත් බැංකුව පීඑල්සී;
4. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී;
5. ඩී.එෆ්.සී.සී බැංකුව පීඑල්සී;
6. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී;
7. ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී;
8. යූනියන් බැන්ක් ඔෆ් කලම්බො පීඑල්සී;
9. සණස සංවර්ධන බැංකුව පීඑල්සී;
10. නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පීඑල්සී; සහ
11. කාගිල්ස් බැංකුව පීඑල්සී (නිසි විමර්ශනයට යටත්ව)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරිය පනතේ 15 වගන්තිය යටතේ 2025.07.11 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රණවිරු සේවා අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.11.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2023.08.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ වාර්ෂික වාර්තාව (2021/2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ලුණු සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2021/2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.08.21 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.03.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ වාර්ෂික වාර්තාව (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.06.03 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ලුණු සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.05.20 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.03.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා,— මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.03.14 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කම්කරු අමාත්‍යතුමා,— ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත යටතේ 2024.02.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කම්කරු අමාත්‍යතුමා,— ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වගන්තිය යටතේ 2024.06.04 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.22 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.08.23 දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2024.05.14 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.06 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.11.24 සහ 2026.02.05 යන දිනයන්හි දී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2026.02.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2026 ඔක්තෝබර් 08 බ්‍රහස්පතින්දා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 ඔක්තෝබර් 08 බ්‍රහස්පතින්දා)**

2166/2026

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) 'දිට්වා' සුළි කුණාටුවෙන් හානියට පත් රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වලට සිදුවූ හානියේ ස්වභාවය සහ ඇස්තමේන්තුගත හානිය;

(iii) එම පාසල්වල හානි යථා තත්වයට පත්කිරීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට රජය, අමාත්‍යාංශය, පළාත් සභා, විදේශ ආධාර වැඩසටහන් සහ අනෙකුත් ආයතන මඟින් ලබාදී ඇති මූල්‍ය ප්‍රතිපාදන;

(iv) එම මූල්‍ය ප්‍රතිපාදන මඟින් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන ලද පාසල් සංඛ්‍යාව;

(v) මේ වනවිට සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා හෝ ප්‍රතිසංස්කරණය කර නොමැති පාසල් සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අලුත්වැඩියා හෝ ප්‍රතිසංස්කරණය කර නොමැති පාසල් යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය මුළු මුදල කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2344/2026

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේ සිට 2026 වර්ෂයේ මේ දක්වා වූ කාලසීමාව තුළ ලියාපදිංචි කරන ලද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව;

(ii) එම කාලසීමාව තුළ ඩෙංගු රෝගයෙන් මියගිය සංඛ්‍යාව, දිස්ත්‍රික්කය සහ වර්ෂය අනුව;

(iii) 2026 වර්ෂයේ මේ දක්වා ලියාපදිංචි කරන ලද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව සහ මියගිය සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය, මාසය, වයස් කාණ්ඩය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඩෙංගු රෝගීන් වැඩි වශයෙන් වාර්තා වන දිස්ත්‍රික්ක සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාස කවරේද;

(ii) 2025 සහ 2026 යන වර්ෂවලදී ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ පළාත් පාලන ආයතන මට්ටමින් රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග සඳහා එක් එක් වර්ෂයේ වෙන් කළ සහ වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2355/2026

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම, මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල පිහිටි ප්‍රාදේශීය මූලික රෝහල්වල අනුමත කාර්ය මණ්ඩලය, මේ වනවිට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු ඇති තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම රෝහල් අතරින් ගිලන්රථ පහසුකම් නොමැති හෝ ප්‍රමාණවත් ගිලන්රථ පහසුකම් නොමැති රෝහල් කවරේද;

(iii) එම රෝහල් සඳහා ගිලන්රථ ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන සිද්ධ වෛද්‍ය රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල සංඛ්‍යාව රෝහල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල් අතරින් නේවාසික පහසුකම් සහිත රෝහල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් පුරවා තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මන්නාරම සිලාවතුර රෝහල සහ ඉරණඉලුප්පෙයිකුලම් ප්‍රාථමික සෞඛ්‍ය රෝහල උත්ශ්‍රේණිගත කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් පිළිබඳව දන්නේද;

(ii) එසේ නම්, උත්ශ්‍රේණිගත කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එම රෝහල් උත්ශ්‍රේණිගත කිරීමට අපේක්ෂිත කාලරාමුව කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 ඔක්තෝබර් 09 සිකුරාදා)**

2332/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයේදී ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 'ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ජාතික ප්‍රතිපත්තිය 2024-2034' පිළිබඳව දන්නේද;

(ii) එම ප්‍රතිපත්තියේ සඳහන් පරිදි ශ්‍රී ලංකාව තුළ වෘත්තිකයන් ලෙස රජයේ ලියාපදිංචිවී නොමැති පරම්පරාගත වෛද්‍යවරුන්ගේ 'පාරම්පරික වෛද්‍ය දැනුම' සහ භාවිතයන් ශක්තිමත් කිරීම සහ සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් ආදිවාසීන්ගේ සහ පාරම්පරික ප්‍රජාවන්ගේ 'බුද්ධිමය දේපල' අයිතිවාසිකම් පිළිගන්නේද;

(iii) එම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම පාරම්පරික ප්‍රජාවන්ගේ 'බුද්ධිමය දේපල' අයිතිවාසිකම් මේ වනවිට පවතින පනත මඟින් ආරක්ෂා කර ඇති බව පිළිගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2333/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින මහාධිකරණ සංඛ්‍යාව කොපමණද;

(ii) 2017 අංක 26 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත මඟින් ශ්‍රී ලංකාවේ සේවය කළ හැකි උපරිම මහාධිකරණ විනිසුරුවන් සංඛ්‍යාව 75 සිට 110 දක්වා ඉහළ නංවා ඇති බව දන්නේද;

(iii) 2026.08.01 දින වනවිට ශ්‍රී ලංකාවේ සිටින මහාධිකරණ විනිසුරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදිරියේදී මහාධිකරණ සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(vi) එම මහාධිකරණ පිහිටුවීමට නියමිත ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පවතින සිවිල් අභියාචනා මහාධිකරණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිවිල් අභියාචනා මහාධිකරණ සඳහා යොදවා ඇති මහාධිකරණ විනිසුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ පවතින වාණිජ මහාධිකරණ සංඛ්‍යාව කොපමණද;

(iv) වාණිජ මහාධිකරණ සඳහා යොදවා ඇති මහාධිකරණ විනිසුරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අනුමත කර ඇති 110ක් වූ මහාධිකරණ විනිසුරුවරුන් සංඛ්‍යාව 2026.08.01 දින වනවිට සම්පූර්ණයෙන් පත් කර නොතිබීමට හේතුව කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2356/2026

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල —

(i) වෙරළ ඛාදනයට ලක්ව ඇති/ලක්වන වෙරළබඩ ප්‍රදේශ සහ ගම්මාන පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව තිබේද;

(ii) එසේ නම්, බලපෑමට ලක්වූ ප්‍රදේශ, පවුල් හා පුද්ගලයන් සංඛ්‍යාව, ධීවර පවුල් සහ නිවාස සංඛ්‍යාව, ඉඩම්, ධීවර තොටුපළ ඇතුළු පොදු යටිතල පහසුකම්වලට සිදුව ඇති හානි, එක් එක් දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා ග්‍රාම නිලධාරි කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත දිස්ත්‍රික්කවල අනාගතයේදී වෙරළ ඛාදනයට වැඩි වශයෙන් ලක්විය හැකි ප්‍රදේශ විද්‍යාත්මකව හඳුනාගෙන තිබේද;

(ii) එම ප්‍රදේශවල ඛාදනය වැළැක්වීමට වෙරළ ආරක්ෂණ බැම්, වෙරළ සංරක්ෂණ, ස්වාභාවික ආරක්ෂණ හෝ වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේද;

(iii) බලපෑමට ලක්වූ ජනතාවගේ පැමිණිලි සඳහා කඩිනම් විසඳුම් ලබාදීමට නිලධාරීන් හෝ සම්බන්ධීකරණ කමිටු පත් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 ඔක්තෝබර් 20 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2128/2026

ගරු සුජීව දිසානායක මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව මේ දක්වා සහභාගිවී ඇති ජාත්‍යන්තර ටෙස්ට් සහ එක්දින ක්‍රිකට් තරග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර ටෙස්ට් සහ එක්දින ක්‍රිකට් ක්‍රීඩා තරග පැවැත්විය හැකි ක්‍රීඩාංගන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ජාත්‍යන්තර ක්‍රිකට් තරග පැවැත්විය හැකි ක්‍රීඩාංගන පිහිටා තිබේද;

(ii) දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා කළ ක්‍රීඩකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ක්‍රීඩකයන්ගේ නම් සහ ඔවුන් නියෝජනය කළ පාසල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඩී.බී. වෙලගෙදර ක්‍රීඩාංගනය ජාත්‍යන්තර ක්‍රිකට් තරග පැවැත්විය හැකි ක්‍රීඩාංගනයක් වන්නේද;

(ii) එම ක්‍රීඩාංගනයේ පවත්වා ඇති ජාත්‍යන්තර ක්‍රිකට් තරග සංඛ්‍යාව කොපමණද;

(iii) ක්‍රීඩාංගනයේ අවසන් වරට ජාත්‍යන්තර ක්‍රිකට් තරගයක් පවත්වා ඇති දිනය කවරේද;

(iv) මෙම ක්‍රීඩාංගනයේ අයිතිය පැවති ආයතනය කවරේද;

(v) මේ වනවිට වෙනත් ආයතනයකට එම ක්‍රීඩාංගනය පවරා තිබේද;

(vi) එසේ නම්, එලෙස අයිතිය පවරා ඇති පදනම කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2139/2026

ගරු දිනේෂ් හේමන්ත මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2025 වර්ෂයේදී සුනඛයන් සපා කෑම හේතුවෙන් ජලභීතිකා රෝගය වැළඳී මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වර්ෂයේදී ජලභීතිකා රෝගීන් සඳහා ප්‍රතිකාර සහ එන්නත්කරණ කටයුතු වෙනුවෙන් වැය කර ඇති මුදල කොපමණද;

(iii) සුනඛයින් වන්ධ්‍යාකරණය කිරීම සඳහා එම වර්ෂයේදී වෙන් කළ මුළු මුදල කොපමණද;

(iv) එම මුදල් භාවිතා කොට වන්ධ්‍යාකරණයට ලක්කළ වීදි සුනඛයින් සංඛ්‍යාව කොපමණද;

(v) සුනඛයින් වන්ධ්‍යාකරණ වැඩසටහන සඳහා 2026 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශයට වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(vi) එම මුදල් භාවිතා කර 2026 වර්ෂයේ මේ වනවිට වන්ධ්‍යාකරණයට ලක් කළ වීදි සුනඛයින් සංඛ්‍යාව කොපමණද;

(vii) අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සුනඛයින් වන්ධ්‍යාකරණය කිරීමේ වැඩසටහනේ ස්වභාවය පිළිබඳව කෙටි විස්තරයක් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2163/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්මිරිස් නිෂ්පාදනයට ප්‍රධාන වශයෙන් දායක වන දිස්ත්‍රික්ක කවරේද;

(ii) මේ වනවිට මෙරට වගා කරනු ලබන ගම්මිරිස් ප්‍රභේද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගම්මිරිස් වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පර්යේෂණ ආයතනයක් තිබේද;

(ii) එසේ නම්, මේ වනවිට ආරම්භ කර ඇති පර්යේෂණ කවරේද;

(iii) ගම්මිරිස් වගාව ව්‍යාප්ත කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2192/2026

ගරු රුවන් විජේවීර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපනවේදී උපාධියක් රජයේ පාසලක ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා මූලික සුදුසුකමක් ලෙස සලකනු ලබන්නේද;

(ii) එම උපාධි පාඨමාලාව සම්පූර්ණ කර මේ දක්වා ගුරු සේවයට බඳවාගෙන නොමැති රාජ්‍ය සහ පෞද්ගලික උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2197/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාම නිලධාරි සේවය සඳහා අනුමත නිලධාරි සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) ග්‍රාම නිලධාරි සේවා ව්‍යවස්ථාව, වැටුප් විෂමතා, බඳවාගැනීමේ පටිපාටිය, උසස්වීම් සහ අනෙකුත් දීමනා සම්බන්ධයෙන් මතුව ඇති ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2207/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ලංකාවේ වාර්ෂික කජු නිෂ්පාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ ශ්‍රී ලංකා කජු සංස්ථාව සතු ඉඩම් ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් කාලය තුළ සංස්ථාව සතු ඉඩම්වල කජු වගා කර ඇති ඉඩම් ප්‍රමාණය සහ කජු වගා නොකළ ඉඩම් ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සංස්ථාව සතු ඉඩම්වල වුවද විධිමත් පරිදි කජු වගා කිරීමට සංස්ථාව අසමත් වීමට බලපා ඇති සාධක කවරේද;

(v) එම තත්ත්වය මඟහරවා කජු සංස්ථාව සතු ඉඩම්වල විධිමත් පරිදි කජු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2231/2026

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ මේ වනවිට සේවය කරනු ලබන සෞඛ්‍ය කණිෂ්ඨ කාර්ය සහායකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2010 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා කාලය තුළ එම තනතුර සඳහා බඳවා ගත් සංඛ්‍යාව වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කාලසීමාව තුළ වැඩිම සෞඛ්‍ය කණිෂ්ඨ කාර්ය සහායකයින් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබූ වර්ෂ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2026 වර්ෂයේ සෞඛ්‍ය කණිෂ්ඨ කාර්ය සහායකයින් බඳවා ගැනීම සඳහා නිකුත් කරන ලද ගැසට් නිවේදනයට පොළොන්නරුව සහ බදුල්ල දිස්ත්‍රික්ක ඇතුළත් නොකිරීමට හේතු කවරේද;

(ii) ඒ හේතුවෙන් ඉහත සඳහන් දිස්ත්‍රික්ක දෙකට අසාධාරණයක් සිදුව ඇති බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2249/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ 2025.01.01 දින සිට මේ දක්වා එක් එක් කන්නය තුළ වී වගා කර ඇති භූමි ප්‍රමාණය ගොවිජන සේවා කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම කාලය තුළ දිස්ත්‍රික්කයේ සමස්ත වී අස්වැන්න එක් එක් කන්නය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වී අස්වැන්නෙන් රජයේ වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වී ප්‍රමාණය එක් එක් කන්නය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වී ගොවීන් මුහුණ දෙන ගැටලු සඳහා විසඳුම් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2294/2026

ගරු සුරංග රත්නායක මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තඹුත්තේගම මූලික රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහලෙන් පසුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැඩිම බාහිර හා නේවාසික රෝගීන් සංඛ්‍යාවකට ප්‍රතිකාර සපයන රෝහල බවත්;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රෝගීන් විශාල පිරිසක්ද එම රෝහලෙන් ප්‍රතිකාර ලබාගන්නා බවත්;

(iii) A ශ්‍රේණියේ මූලික රෝහලක් වන එහි අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව වෛද්‍ය, හෙද හා අනෙකුත් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ හිඟයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෝහලේ පවතින කාර්ය මණ්ඩල හිඟය පියවා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාලසීමාව කවරේද;

(iii) රෝහල පළාත් සභාව යටතේ පාලනය වුවද, එහි ඇතැම් සේවා සහ සංවර්ධන කටයුතු මධ්‍යම රජය මඟින් සිදුකරනු ලබන්නේද;

(iv) එසේ නම්, මෙම රෝහල මධ්‍යම රජය යටතට පවරා ගැනීම සඳහා අවධානය යොමුවී තිබේද;

(v) ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(vi) පළාත් සභාව මඟින් පමණක් රෝහලේ නඩත්තු, සංවර්ධන සහ සේවා අවශ්‍යතා සපුරාලීමේදී ගැටලු පවතින්නේද;

(vii) එසේ නම්, එම ගැටලු නිරාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2328/2026

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සමස්ත කිරි නිෂ්පාදනයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයට හිමිවන ස්ථානය කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ කිරි ගොවියන්ගේ සහ කුකුළු පාලනයේ නිරත ගොවීන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ පශු වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු පවතින බවත්;

(ii) එම කාර්යාල සඳහා වාහන අවශ්‍යතා පවතින බවත්;

(iii) දිට්වා සුළි කුණාටුවෙන් විනාශයට පත්වූ පූඩළුඔය පශු වෛද්‍ය කාර්යාලය මේ දක්වා වසා දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත (ආ) (i), (ii) සහ (iii) සම්බන්ධයෙන් මේ දක්වා ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 ඔක්තෝබර් 20 අඟහරුවාදා)**

2254/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ඉන්දියාව සමඟ විදුලි, ඩිජිටල්, ඉන්ධන නළ මාර්ග සහ ප්‍රවාහන සම්බන්ධතා වර්ධනය කර ගැනීම සුදුසු බව පිළිගන්නේද;

(ii) එම අරමුණින් 2025.04.05 දින හෝ ඊට ආසන්න දිනයකදී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ගිවිසුම මගින් ඉටු කර ගැනීමට අපේක්ෂිත මූලික අරමුණු සහ ඉලක්ක කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ධනුෂ්කොඩි සහ තලෙයිමන්නාරම අතර පෝක් සමුද්‍ර සන්ධියේ උපායමාර්ගික යටිතල පහසුකම් කොරිඩෝව ඉදි කිරීමේ මෙතෙක් ලබා ඇති ප්‍රගතිය කවරේද;

(ii) කොටසක් ඉහළින් යන පාලමකින් සහ ඉතිරි කොටස මුහුද යට උමඟකින් යුත් භෞතික සම්බන්ධතාවක් ගොඩ නැඟීම සඳහා මේ වනවිට ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සාකච්ඡාවක් ආරම්භවී තිබේද;

(iii) එම ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකාවට සහ ඉන්දියාවට ලැබෙන ද්විපාර්ශ්වික වාසි කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2258/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර 2025.04.05 දින අත්සන් කරන ලද ආරක්ෂක සහයෝගිතා අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ඇති කර ගන්නා ලද එකඟතා කවරේද;

(ii) එම එකඟතා අතරින් මේ වනවිට ක්‍රියාත්මක කර අවසන් කර ඇති කටයුතු කවරේද;

(iii) ගිවිසුම පරිදි ඇති කරගන්නා ලද එකඟතාවයන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවී තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රමාදයට හේතු කවරේද;

(v) එම ගිවිසුම ප්‍රකාරව ඉන්දියාව සමඟ ඇති කරගෙන ඇති එකඟතාවයන් අනුව ක්‍රියා කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2334/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ආයුර්වේද සංරක්ෂණ සභා' පිහිටුවා ඇති නීතිමය ප්‍රතිපාදන සහ එහි කාර්යභාරය කවරේද;

(ii) මෙම සභා නියෝජනය කරන පාරම්පරික සහ ආයුර්වේද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නියෝජනයන් අතරින් වැඩි නියෝජනයක් හිමි වන වෛද්‍ය කාණ්ඩය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම සභා සතුව පැවති, පාරම්පරික වෛද්‍ය සිසුන් පිළිබඳ රජයේ වගවීම ඉවත් කරන ලද වර්ෂය සහ එසේ සිදු කිරීමේ අරමුණ කවරේද;

(ii) එම සභා පවත්වා ගැනීම සඳහා පසුගිය වර්ෂ 10 තුළ රජය විසින් එක් එක් සභා සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සභා සවිබල ගැන්වීම සඳහා රජයේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වන්නේද;

(iv) සභාවල මේ වනවිට පවතින ගැටලු හඳුනාගෙන තිබේද;

(v) එසේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම සභා මඟින් 'වෙද ගෙදර' ව්‍යාපෘතිය සිදු කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා පසුගිය වර්ෂ 05 තුළ වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 ඔක්තෝබර් 21 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

33/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2018 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය සහ එහි ප්‍රතිශතය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය උදෙසා වෙන් කරන මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

143/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා සිදුවූ ඇතැම් අපරාධ සිදුවීම් කාලයත් සමඟ යටපත් වන ස්වභාවයක් පවතින බවත්;

(ii) එවැනි සිදුවීම් පිළිබඳව නැවත පරීක්ෂණ ආරම්භ කරන බවට වර්තමාන රජය විසින් ප්‍රකාශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හඳුනාගත් එවැනි අපරාධ සිදුවීම් සංඛ්‍යාව සහ ඒවායේ ස්වරූපය කවරේද;

(ii) එම සිදුවීම් සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2298/2026

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025 වර්ෂය තුළ ශ්‍රී ලංකාවෙන් වාර්තාවූ වනඅලි මරණ සංඛ්‍යාව;

(ii) එම වර්ෂය තුළ සිදුවූ වනඅලි ප්‍රහාර සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වනඅලි සංක්‍රමණික තීරු (අලිමංකඩ) සහ ඒ ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන පරිදි මේ වනවිට පවතින විදුලි වැටවල මුළු දිග කිලෝමීටර කොපමණද;

(ii) 2025 වර්ෂය තුළ විදුලි වැටවල් ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා වැය කරන ලද මුළු පිරිවැය කොපමණද;

(iii) අලි-මිනිස් ගැටුමට සහ වනඅලි තර්ජනයට විසඳුම් සෙවීම සඳහා 2026 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් සකස් කර ඇති සැලැස්ම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2300/2026

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ නරිපුල්තෝට්ටම්, කින්නයඩි, සන්දිවෙලි, මණ්ඩූර්, අම්බිලාන්තුරෙයි සහ කාන්ජිරන්කුඩා යන ප්‍රදේශවල පාලම් ඉදිකිරීමට යෝජනාවී ඇති බවත්;

(ii) එම පාලම් ඉදිකිරීම පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වගකීමක් වන බවත්;

(iii) ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් මෙතෙක් එම පාලම් ඉදිකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම පාලම් ඉදිකිරීම මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පවරා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නරිපුල්තෝට්ටම් පාලම සඳහා ශක්‍යතා අධ්‍යයනය සහ විදුම් සිදුරු පරීක්ෂණ අවසන් කර තිබේද;

(ii) එසේ නම්, එම පාලම ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වන රුපියල් මිලියන 850න් කොටසක් හෝ 2027 අයවැයෙන් වෙන් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2326/2026

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2026.08.12 දින වනවිට සියලුම බන්ධනාගාරවල සිටින සැකකරුවන් සහ සිරකරුවන් සංඛ්‍යාව;

(ii) වයස අවුරුදු 20-30 අතර, 30-40 අතර, 40-50 අතර, 50-60 අතර, 60-70 අතර සහ 80ට වැඩි යන වයස් කාණ්ඩ අනුව සිටින සිරකරුවන් සංඛ්‍යාව;

(iii) එම සිරකරුවන් අතරින් රු.10,000/-, රු.15,000/-, රු.25,000/-, රු.50,000/- සහ රු.100,000/- ඉක්මවන දඩ මුදල් ගෙවීමට නොහැකිව බන්ධනාගාරගතව සිටින සිරකරුවන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මැගසින්, මහර, කුරුවිට සහ පල්ලන්සේන බන්ධනාගාරවල ඇතිවූ ගැටුම්වලින් මියගිය බන්ධනාගාර නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිලධාරීන්ගේ නම්, තනතුරු සහ ලිපින කවරේද;

(iii) එම නිලධාරීන් වෙනුවෙන් රජය විසින් වන්දි ලබාදී තිබේද;

(iv) එසේ නම්, එක් එක් නිලධාරියා සඳහා ලබාදී ඇති වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ගැටුම් වලින් මේ වනවිට මියගොස් ඇති සිරකරුවන් සහ සැකකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2353/2026

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතෙන් අනෙකුත් පළාත්වලටත්, අනෙකුත් පළාත්වලින් උතුරු පළාතටත් ස්ථාන මාරුවීම් ලබා වර්ෂ 10කට වැඩි කාලයක් සේවය කළද, තමන්ගේ මුල් පළාත් වෙත යළි ස්ථාන මාරුවීම් ලබා ගැනීමට නොහැකිව සිටින ගුරුවරුන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ අවධානය යොමුවී තිබේද;

(ii) එම ගුරුවරුන්ගේ දිගු කාලීනව පවුලෙන් වෙන්ව සිටීම, මානසික යහපැවැත්ම, ඉගැන්වීමේ කාර්ය සාධනය සහ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු කෙරෙහි ඇති කරන බලපෑම සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(iii) සේවා අවශ්‍යතා සහ පාසල්වල ගුරු හිඟය සැලකිල්ලට ගනිමින්, මානුෂීය පදනම මත එම ගුරුවරුන්ට තම මුල් පළාත් වෙත ස්ථාන මාරුවීම් ලබා දීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2402/2026

ගරු තිළිණ සමරකෝන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු සංචාරක බංගලා සංඛ්‍යාව කොපමණද;

(ii) කලා වැව් බැම්ම මත අධිකාරිය සතු සංචාරක බංගලාවක් තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට එය ක්‍රියාත්මක වන්නේද;

(iv) එම බංගලාවේ මේ වනවිට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2025 සහ 2026 කාලසීමාව තුළ —

(i) එම බංගලාවේ සේවකයන් සඳහා වැටුප් වශයෙන් ගෙවා ඇති මුදල;

(ii) බංගලාවේ ජල, විදුලි, දුරකථන සහ අන්තර්ජාල බිල්පත් සඳහා ගෙවා ඇති මුදල;

(iii) නවාතැන් ගත් පුද්ගලයන් වෙනුවෙන් දරා ඇති මුළු වියදම;

(iv) ආයතනික කටයුතු සඳහා එහි කාමර හෝ සම්පූර්ණ පරිශ්‍රය භාවිතා කර ඇති දින ගණන සහ එමඟින් ඉපැයූ ආදායම;

(v) බාහිර පුද්ගලයන්, සංවිධාන හෝ ආයතන විසින් කාමර හෝ සම්පූර්ණ පරිශ්‍රය භාවිතා කර ඇති දින ගණන සහ එමඟින් ඉපැයූ ආදායම;

(vi) බංගලාවේ නඩත්තු සහ ඉදිකිරීම් සඳහා වැය කර ඇති මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත කාලසීමාව තුළ ආයතනික කටයුතු හෝ බාහිර පුද්ගලයින්, සංවිධාන හෝ ආයතන විසින් සංචාරක බංගලාව යොදාගෙන ඇති කාර්යයන් කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2413/2026

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ රාජ්‍ය ආයතන සඳහා වෙන් කරන ලද, නාගරික සංවර්ධන අධිකාරියට අයත්ව තිබූ මුළු ඉඩම් ප්‍රමාණය සහ ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(ii) 2026.07.01 දින වනවිට විවිධ ආයතන සඳහා ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය සහ ඉඩම් කැබලි සංඛ්‍යාව එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ රජයට අයත් ඉඩම් කැබලි පෞද්ගලික පාර්ශ්වයන්ට පවරාදී තිබේද;

(ii) එසේ නම්, එම පැවරීම් සඳහා පදනම, ඉඩම් ප්‍රමාණය, වටිනාකම සහ කාලසීමාව කවරේද;

(iii) නොඑසේ නම්, එම ඉඩම් සින්නක්කරව පවරාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය කටයුතු සඳහා පවරාගත් ඉඩම් පෞද්ගලික පාර්ශ්වයන්ට පැවරීමේ නීතිමය තත්ත්වය කවරේද;

(ii) එවැනි පැවරීම් නීතිවිරෝධී බව තහවුරු වුවහොත් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2456/2026

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වතු ආශ්‍රිත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් පාසල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසල්වල පවතින ශිෂ්‍ය-ගුරු අනුපාතය කවරේද;

(iv) එම පාසල්වල අධ්‍යාපනය ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වතු ආශ්‍රිත පාසල්වලට වාර්ෂිකව පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් වන සිසුන් සංඛ්‍යාවේ සාමාන්‍යය කොපමණද;

(ii) 2026 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් කරන ලද සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) වතු ආශ්‍රිත පාසල්වලින් 2025 වර්ෂයේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් ප්‍රතිශතය කොපමණද;

(iv) එම විභාගයෙන් සමත්වූ සිසුන් ප්‍රතිශතය කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2470/2026

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 15 තුළ ගොවි ජනතාව සඳහා වාර්ෂිකව පොහොර සහනාධාරය වෙනුවෙන් වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම වර්ෂවල ලෝක වෙළඳපොළ තුළ පැවති පොහොරවල මිල ගණන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2025 වර්ෂයේ පොහොර සහනාධාර සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iv) පොහොර සහනාධාරය ලබාදී ඇති වගාවන් කවරේද;

(v) වර්තමාන රජය බලයට පත්වීමට පෙර සියලු ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබාදී තිබූ බව පිළිගන්නේද;

(vi) පොහොර මිල අධික ලෙස ඉහළ ගොස් ඇති බැවින්, එම මිල ගණන් අඩු කිරීමට රජය පියවර ගන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 ඔක්තෝබර් 22 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

200/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ මෙම කන්නයේ පොහොර සහනාධාර ලැබූ ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ගොවි ජන කොට්ඨාස අනුව එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සහනාධාරය සඳහා රජය විසින් වැය කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) සහනාධාරය නිවැරදිව සහ විධිමත්ව ලබාදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

372/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රට පුරා එක්වරම කාබනික ගොවිතැනට යොමු කිරීම සඳහාවූ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට රජයට උපදෙස් දුන් නිලධාරීන් සහ ඔවුන් දැරූ තනතුරු කවරේද;

(ii) එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම නිසා රටට සිදුවූ හානිය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) ඔවුන්ට එරෙහිව අපරාධ නීතිය අනුව ගෙන ඇති පියවර කවරේද;

(iv) එම නිලධාරින්ගෙන් වන්දි අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

476/2025

ගරු රවී කරුණානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රටේ මුළු පානීය ජල අවශ්‍යතාවය, පසුගිය වර්ෂ 05 සඳහා වාර්ෂික ජල භාවිතය සහ ඉදිරි වර්ෂ 10 සඳහා අපේක්ෂිත පානීය ජල අවශ්‍යතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජල සැපයුම සඳහා භාවිතා කරන ජලාශ සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(iii) සපයනු ලබන ජල ප්‍රමාණය එක් එක් ජලාශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජල සැපයුමේ ඇති විය හැකි යම් හිඟයක් විසඳීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) පසුගිය වර්ෂ 05 තුළ ජලය ලීටරයකට නිෂ්පාදන පිරිවැය, ලීටරයකට විකුණුම් මිල සහ ලීටරයක විකුණුම් වටිනාකම මත පැනවූ බදු ප්‍රමාණ මේ දක්වා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මුළු සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(vii) මණ්ඩලයේ වැටුප් හා වේතන සඳහා මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රට තුළ මුහුදු ජල ලවණහරණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම මධ්‍යස්ථානයන්හි නම් කවරේද;

(iii) එම එක් එක් මධ්‍යස්ථානයෙහි ලීටරයකට නිෂ්පාදන පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

685/2025

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ‘ළඟම පාසල හොඳම පාසල’ ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාතේ රජයේ පාසල්වල ආරම්භ කර ඇති ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

(iii) මේ වනවිට එම ව්‍යාපෘති අතරින් අතරමග නතරවී ඇති ව්‍යාපෘති සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(iv) එම ව්‍යාපෘති සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

771/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1987 සිට 1990 දක්වා කාලසීමාව තුළ ජනතා විමුක්ති පෙරමුණ විසින් එල්ල කළ පහරදීම්වලට ලක්වූ යුද හමුදා කඳවුරු සහ පොලිස් ස්ථාන කවරේද;

(ii) එම පහරදීම් හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත්වූ සහ මියගිය හමුදා සාමාජිකයින් සහ පොලිස් නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පහරදීම්වලින් පැහැර ගන්නා ලද ආයුධ සංඛ්‍යාව කොපමණද;

(iv) ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගන්නා ලද ආයුධ සංඛ්‍යාව කොපමණද;

(v) නැවත රජය වෙත භාර දෙන ලද ආයුධ සංඛ්‍යාව කොපමණද;

(vi) අත්අඩංගුවට ගෙන හෝ භාරදී නොමැති ආයුධ සංඛ්‍යාව කොපමණද;

(vii) රජයේ භාරයට ගෙන නොමැති ආයුධ සම්බන්ධයෙන් රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

905/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාත්තන්කුඩි නගර සීමාවට අයත් ප්‍රදේශවල සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල ප්‍රතිසංස්කරණය කළ යුතු සහ අලුතින් ස්ථාපිත කළ යුතු ජලාපවහන පද්ධති පවතින බව දන්නේද;

(ii) පවතින ජලාපවහන පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට සහ නව ජලාපවහන පද්ධති ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

988/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව මේ වනවිට ඇති ඉන්ධන ප්‍රවාහන බවුසර් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉන්ධන ප්‍රවාහන කටයුතු සඳහා සංස්ථාව යටතේ ලියාපදිංචිවී ඇති බවුසර් රථ හිමිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම බවුසර් රථ හිමියන්ගේ හෝ සමාගම්වල නම් සහ ලිපින කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉන්ධන ප්‍රවාහනය වෙනුවෙන් බවුසර් රථ හිමියන්ට ගෙවීම් සිදු කරන ක්‍රමවේදය කවරේද;

(v) එම කාලසීමාව තුළ ඉන්ධන ප්‍රවාහනය වෙනුවෙන් බවුසර් රථ හිමියන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඉන්ධන ප්‍රවාහනය සඳහා දුම්රිය වැනි රාජ්‍ය අංශයේ ප්‍රවාහන සේවා වැඩි වශයෙන් භාවිතා කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1496/2025

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තාණ්ඩියඩි ගම්මානයේ පිහිටි සුසාන භූමියෙහි විශේෂ කාර්ය බලකායට අයත් කඳවුරක් ස්ථාපිත කර ඇති බව පිළිගන්නේද;

(ii) එම සුසාන භූමියේ මිහිදන් කර ඇති පුද්ගලයන් වෙනුවෙන් ඥාතීන් විසින් පවත්වනු ලබන අනුස්මරණ වැඩසටහන් සඳහා අනුමැතිය ලබාදීම ප්‍රතික්ෂේප කර තිබේද;

(iii) 2025.08.13 වන දින මඩකලපුවේදී පැවැති විශේෂ සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී අදාළ ස්ථානය නිරීක්ෂණය කර අනුස්මරණ කටයුතු සඳහා එම භූමියෙන් කොටසක් වෙන් කිරීම සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයට අනුකූලව මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඉදිරියේදී අදාළ සුසාන භූමිය තුළ අනුස්මරණ වැඩසටහන් පැවැත්වීමට ඥාතීන්ට අවස්ථාව ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව උතුර අධ්‍යාපන කලාපයට අයත් තාණ්ඩියඩි රජයේ දෙමළ මිශ්‍ර පාසලේ ක්‍රීඩාංගනය මේ වනවිට විශේෂ කාර්ය බලකා කඳවුරු පරිශ්‍රයට ඈඳාගෙන තිබේද;

(ii) පාසල් සිසුන්ගේ සහ පාසලේ කටයුතු වෙනුවෙන් එම ක්‍රීඩාංගනය නැවත පාසල වෙත මුදාහැරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1669/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය ඇන්තූරියම් වගාකරුවන් ලෙස ලියාපදිංචිවී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඇන්තූරියම් වගාව සඳහා ඔවුන්ට රජය විසින් පහසුකම් සපයන්නේද;

(iii) එසේ නම්, එම පහසුකම් කවරේද;

(iv) දේශීය වගාකරුවන්ට අමතරව ඇන්තූරියම් මල් ආනයනය කිරීම සඳහා වෙනත් පාර්ශ්ව සඳහා අවසර ලබාදී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2398/2026

ගරු අජිත් ගිහාන් මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ප්‍රජා ශක්ති සංවර්ධන වැඩසටහන මඟින්,—

(i) බහුමාන දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) විශේෂ අවශ්‍යතා සහිත පාසල් දරුවන් සඳහා මූල්‍යාධාර හෝ වෙනත් සහනාධාර ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම සහනාධාර කවරේද;

(v) ආබාධ සහිත පුද්ගලයින් සඳහා ක්‍රියාත්මක වන සුබසාධන වැඩසටහන් තිබේද;

(vi) එසේ නම්, එම වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 ඔක්තෝබර් 23 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

788/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රතු නිවේදන නිකුත් කර ඇති මේ වනවිට විදේශ රටවල සැඟවී සිටින ශ්‍රී ලාංකික අපරාධකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම් සහ සැඟවී සිටින රටවල් කවරේද;

(iii) 2020 වර්ෂයේ සිට ඔවුන් විසින් මෙහෙයවන ලද අපරාධ සහ ඝාතනය කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අපරාධකරුවන් මෙරටට ගෙන්වා ගැනීම සහ ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

949/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා කොළඹ මහ නගර සභා බලප්‍රදේශයෙන් වාර්තාවී ඇති ක්ෂය රෝගීන් සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ක්ෂය රෝගය ඇතිවීමට බලපාන සාධක කවරේද;

(iii) කොළඹ මහ නගර සභා සීමාව තුළ ක්ෂය රෝගය පැතිර යෑම වැළැක්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1042/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින්ට තමන් සේවය කරන පාසලට හෝ වෙනත් රජයේ පාසලකට සිය දරුවන් ඇතුළත් කිරීම සඳහා මීට පෙර අවස්ථාව ලබාදී තිබූ බව දන්නේද;

(ii) එම පහසුකම වර්තමාන රජය විසින් චක්‍රලේඛයක් හෝ වෙනත් නීතිමය ක්‍රියාමාර්ගයක් මඟින් ඉවත් කර හෝ සංශෝධනය කර තිබේද;

(iii) අදාළ පහසුකම නැවත ලබාදීමට අදහස් කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1079/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ දූත මණ්ඩලවලදී විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් සැකසීම සඳහා ගතවන සාමාන්‍ය කාලය කොපමණද;

(ii) නියමිත විදේශ ව්‍යවහාර මුදල් ගාස්තු ගෙවා තිබියදීත්, එම කටයුතු ප්‍රමාද වීමට හේතු කවරේද;

(iii) හදිසි අවස්ථා සඳහා කඩිනම් ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ කොන්සියුලර් කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) දූත මණ්ඩල කාර්ය මණ්ඩලයට එරෙහිව ලැබෙන පැමිණිලි විසඳීම සඳහා පවතින යාන්ත්‍රණ කවරේද;

(iii) අල්ලස් ලබාගැනීම සඳහා තැරැව්කරුවන් සමඟ රහසිගතව සම්බන්ධවී කටයුතු කරන බවට එල්ලවී ඇති චෝදනා සම්බන්ධයෙන් විගණන හෝ විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙහි කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා ගනිමින් සිටින පියවර කවරේද;

(ii) විදේශයන්හි සිටින අයදුම්කරුවන් සඳහා මාර්ගගත අයදුම්පත් නිරීක්ෂණ පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කරන්නේද;

(iii) දුක්ගැනවිලි විසඳීමට, ප්‍රමාදවූ අයදුම්පත් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට සහ අධික ලෙස ප්‍රමාදවීම් සඳහා වන්දි ලබාදීම සලකා බැලීමට යෝජනා කර ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1339/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රටවල අත්අඩංගුවට පත්වූ ධීවරයන් සංඛ්‍යාව සහ ධීවර බෝට්ටු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ධීවරයන් සහ බෝට්ටු නිදහස් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1367/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2026 වර්ෂයේ අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපාදන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ පාලම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ඉදිකිරීමට යෝජිත පාලම්වල නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) කල්මුනේ-අක්කරපත්තුව ප්‍රධාන මාර්ගයේ අට්ටප්පලම් පාලම සෑම ගංවතුර තත්ත්වයකදීම හානියට පත්වන බැවින් එම මාර්ගයේ ගමනාගමනයට බාධා ඇතිවන අතර, ගංවතුර අවස්ථාවලදී ඒ වෙනුවට තාවකාලික පාලම් ඉදි කරනු ලබන බව දන්නේද;

(iii) එම පාලම ස්ථිර පාලමක් ලෙස ඉදිකිරීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1381/2025

ගරු නීතිඥ චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ආලේපන වර්ග විෂවීම පිළිබඳ සිද්ධීන් රාශියක් මෑත කාලයේ වාර්තාවූ බව දන්නේද;

(ii) මෙම සුවඳ විලවුන් හා රූපලාවන්‍ය ද්‍රව්‍ය නියාමනය කිරීමේ වගකීම පැවරී ඇති රාජ්‍ය ආයතනය කවරේද;

(iii) සුවඳ විලවුන් හා රූපලාවන්‍ය ද්‍රව්‍ය නිසි පරිදි නියාමනය කිරීම සඳහා අවශ්‍ය වැටලීම් සිදු කිරීමට සහ මෙවැනි විෂවීම් සම්බන්ධ සිදුවීම් වැළැක්වීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1982/2026

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දම්පහල බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඌරුබොක්ක හීගොඩ රෝහලට යාබදව අමාත්‍යාංශය සතුව අක්කර දෙකක පමණ ඉඩමක් පවතින බවත්;

(ii) ගම්සභා උසාවි ක්‍රමය අහෝසි කිරීමෙන් පසුව එම භූමිය භාවිතයට නොගෙන පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉඩම ප්‍රාදේශීය ලේකම්වරයා වෙත හෝ වෙනත් රාජ්‍ය ආයතනයක් වෙත පවරා දීම සඳහා කටයුතු කර තිබේද;

(ii) නොඑසේ නම්, එම ඉඩම පොදු ප්‍රයෝජනය සඳහා හෝ ඌරුබොක්ක හීගොඩ රෝහලේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට පියවර ගන්නේද;

(iii) එම ඉඩමේ වර්තමාන නීතිමය තත්ත්වය සහ අපේක්ෂිත භාවිතය පිළිබඳ වාර්තාවක් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2399/2026

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මේ වනවිට හඳුනාගෙන ඇති අභයභූමි කවරේද;

(ii) එම අභයභූමිවල ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අභයභූමි අතරින් ගැසට් කර ඇති අභයභූමි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2412/2026

ගරු චානක මාදුගොඩ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009.05.19 දිනට සහ ඉන් අනතුරුව වර්ෂ 22 ක සේවා කාලයක් සම්පූර්ණ කර විශ්‍රාම ගන්නා රණවිරුවන්ට 85%ක උපරිම විශ්‍රාම වැටුපක් ලබාදීමේදී ඇතැම් නිලධාරින්ට අසාධාරණයක් සිදුව ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම අසාධාරණයට ලක්වූවන්ට උපරිම විශ්‍රාම වැටුප ලබාදීමට පවතින බාධා කවරේද;

(iii) එම නිලධාරින්ට හිමිවිය යුතු විශ්‍රාම වැටුපට අදාළ හිඟ මුදල් ගෙවීමට ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 නොවැම්බර් 03 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1195/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, ඩෙල්ෆ්ට් දූපතේ පිහිටි පාසල් භෞතික සම්පත් ඌනතාවයකින් සහ කාර්ය මණ්ඩල පුරප්පාඩු සහිතව ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ප්‍රදේශයේ පිහිටි යා/ඩෙල්ෆ්ට් මහා විද්‍යාලය අයත් වන පාසල් වර්ගීකරණය කවරේද;

(iii) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පාසලේ විදුහල්පති, ගුරුවරුන් සහ අනධ්‍යයන සේවකයන් ඇතුළු අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(v) මේ වනවිට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය කොපමණද;

(vi) මේ දක්වා කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ නොකිරීමට බලපා ඇති හේතු කවරේද;

(vii) එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කාලසීමාව කොපමණද;

(viii) ගුරු පුරප්පාඩු හේතුවෙන් එම පාසලේ සිසුන් මුහුණදී සිටින ගැටලු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1574/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, තිරුමුරිකණ්ඩි පිල්ලෙයාර් කෝවිල (ගණදෙවි දේවාලය) ඉදිරියේ ඇති ජනාවාස පිටුපස පිහිටි වනාන්තරය රක්ෂිත ප්‍රදේශයක් බවත්;

(ii) 2010 වර්ෂයෙන් පසු එම රක්ෂිතය තුළ වන විනාශයක් සිදුකර ඉදිකිරීම් කර ඇති බවත්;

(iii) එම රක්ෂිතය මෙතෙක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිපාලනයෙන් නිදහස් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත රක්ෂිතයේ නම කවරේද;

(ii) එම වනාන්තර ප්‍රදේශය රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කළ ගැසට් පත්‍රයේ දිනය සහ අංකය කවරේද;

(iii) රක්ෂිතය තුළ සිදුකරන ලද ගස් කැපීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබේද;

(iv) රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරින් විසින් එම ගස් කැපීම සිදුකර ඇත්තේ නීත්‍යානුකූල අනුමැතියක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1684/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කින්නියා ප්‍රදේශයේ ජනගහනය සහ ජල පාරිභෝගිකයින් සංඛ්‍යාවට සාපේක්ෂව, එම ප්‍රදේශයේ පිහිටි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කාර්යාලය ප්‍රමාණවත් නොවන බවත්;

(ii) එම කාර්යාලයට ලබාදී ඇති වාහනය භාවිතයට ගත නොහැකි තත්ත්වයක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මණ්ඩලයේ කින්නියා කාර්යාලය මඟින් නඩත්තු වන පානීය ජල සැපයුම් ලබාදී ඇති පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාලය වෙනුවට, පහසුකම් සහිත නව කාර්යාලයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) කින්නියා ප්‍රදේශයේ නව ජල සම්බන්ධතා සඳහා ඉල්ලුම් කරන පුද්ගලයින් සංඛ්‍යාව ඉහළ ගොස් ඇති බැවින් නව පොදු ජල සම්බන්ධතා පුළුල් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1827/2026

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්ෂයකට මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ සංඛ්‍යාවෙහි සහ තුවාල ලබන සංඛ්‍යාවෙහි සාමාන්‍යය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අනතුරු හේතුවෙන් තාවකාලිකව සහ ස්ථිරව ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයින් සංඛ්‍යාවෙහි සාමාන්‍යය කොපමණද;

(iii) අනතුරුවලට ලක්වූවන් සඳහා වර්ෂයකට වෙන් කරනු ලබන ඇඳන් සංඛ්‍යාවෙහි සහ ඇඳන් භාවිතා කරන දින ගණනෙහි සාමාන්‍යය කොපමණද;

(iv) මාර්ග අනතුරුවලට ලක්වූවන් සඳහා ප්‍රතිකාර ලබාදීම සඳහා වර්ෂයකට වැයවන ආසන්න වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2126/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බස්නාහිර පළාතේ, විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමිති, සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර තිබේද;

(iii) නොඑසේ නම්, ලියාපදිංචිවී නොමැති සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(iv) පළාත තුළ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් සහ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට ඇතුළත් සහ ඇතුළත් නොවූ සමුපකාර බැංකු සංඛ්‍යාව කොපමණද;

(v) 2025.12.31 දිනට පළාත තුළ පවතින සමුපකාර බැංකුවල තැන්පත්කරුවන් සංඛ්‍යාව සහ තැන්පතු ප්‍රමාණය කොපමණද;

(vi) එදිනට තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති සමුපකාර බැංකු සංඛ්‍යාව සහ මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) එම බැංකුවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තැන්පතු සහ ණය ආපසු ලබාගැනීම සඳහා කඩිනම් ක්‍රමවේද සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේද කවරේද;

(iii) ලියාපදිංචි නොවූ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් නොවන සමුපකාර සමිති සහ එම සමිතිවල දූෂණ සහ අක්‍රමිකතා සිදු කළ කළමනාකාරිත්වයට එරෙහිව ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2164/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ගල්ඔය නිම්න ජාතික වනෝද්‍යානය' ජාතික වනෝද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් ගැසට් නිවේදනය නිකුත් කළ වර්ෂය කවරේද;

(ii) එම වනෝද්‍යානය අයත් වන පරිපාලන දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) වනෝද්‍යානයේ මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(iv) මොනරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බදුලුවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි, වනෝද්‍යානයේ සීමාව තුළ වගා කටයුතු සඳහා නීත්‍යානුකූලව අවසර ලබාදී තිබේද;

(v) එසේ නම්, වගා කටයුතු සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වනෝද්‍යානයට අයත් මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බදුලුවෙල ප්‍රදේශයේ රක්ෂිත සීමා තුළ ස්ථිර නිවාස හෝ වෙනත් ගොඩනැගිලි ඉදිකර තිබේද:

(ii) එසේ නම්, එම රක්ෂිත සීමා තුළ මේ වනවිට පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පදිංචිකරුවන් සහ වගාකරුවන් සම්බන්ධ නීතිමය තත්ත්වය කවරේද;

(iv) එම ජනතාවගේ ගැටලු විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2198/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(ii) එම සේවය සඳහා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට එම සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එක් එක් රාජ්‍ය ආයතන තුළ මෙම සේවය සඳහා අනුමත කර ඇති තනතුරු නාම කවරේද;

(v) එම සේවයේ පවතින පුරප්පාඩු හේතුවෙන් අදාළ තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා වෙනත් සේවාවල නිලධාරීන් පත් කර තිබේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(vi) මෙම සේවයේ පවතින පුරප්පාඩු සහ අනෙකුත් ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2275/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන් සංඛ්‍යාව ආබාධිතභාවයේ ස්වභාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආබාධිත පුද්ගලයන්ගේ සුබසාධනය සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2381/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රැකියාවක් සඳහා පිටත්ව ගිය ශ්‍රී ලාංකික ශ්‍රමිකයකු ගිවිසුම්ගත සේවා ස්ථානයේ සේවයේ නියුතු බව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති පසු විපරම් ක්‍රමවේදය කවරේද;

(ii) ශ්‍රමිකයෙකු විදේශගත වීමෙන් පසු ශ්‍රී ලංකාවේ සිටින තම ඥාතීන් සමඟ සබඳතා පවත්වාගෙන යන බව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(iii) විදේශ ශ්‍රමිකයන්ට නියමිත දිනට නියමිත වැටුප ලැබෙන බවත්, උචිත නවාතැන්, ආහාර සහ ශීත ඇඳුම් ඇතුළු අවශ්‍ය පහසුකම් ලැබෙන බවත් තහවුරු කරනු ලබන ආකාරය කවරේද;

(iv) එම ශ්‍රමිකයන්ගේ කායික සහ මානසික සුරක්ෂිතභාවය තහවුරු කරනු ලබන ආකාරය කවරේද;

(v) විදේශ ශ්‍රමිකයන් ගිවිසුම් කාලය අවසානයේ දී ශ්‍රී ලංකාවට පැමිණෙන්නේද, නැතහොත් ගිවිසුම් කාලය දීර්ඝ කරගන්නේද යන්න පිළිබඳ නියාමන ක්‍රමවේදයක් පවත්වාගෙන යනු ලබන්නේද;

(vi) විදේශ රැකියා කාලසීමාව තුළ එම ශ්‍රමිකයාගේ කලත්‍රයා සහ දරුවන්ගේ සුරක්ෂිතභාවය සහ සුබසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2484/2026

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ වෘත්තීන්වලට බඳවාගන්නා ලද ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ සෙසු නිලයන් සේවය අතහැර යාමේ ප්‍රවණතාවක් පවතින්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) සේවය හැර ගොස් විදේශගතව සිට මෙරටට පැමිණීමේදී අත්අඩංගුවට ගනු ලබන හෝ භාරවන නිලධාරින්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) සේවය හැර ගොස් විදේශගතව සිටින නිලධාරින්ට නැවත සේවයට එක්වීමේ හැකියාවක් තිබේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද;

(vi) සේවයෙන් ඉවත් වීමට ඉල්ලුම් කරන නිලධාරියෙකුගේ ඉල්ලීම සම්පූර්ණ කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය සේවකයන්ගේ වර්ෂ 05ක විදේශ නිවාඩු ක්‍රමවේදයට ත්‍රිවිධ හමුදා සාමාජිකයන් ඇතුළත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) එම ක්‍රමවේදය යටතේ විදේශ නිවාඩු ලබාගත් ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම විදේශ නිවාඩු පසුව අවලංගු කර තිබේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(v) සේවය හැරගිය ඉහත (අ)(i)හි සඳහන් පුද්ගලයින්ට පොදු සමා කාලයක් ලබා නොදීමට සහ පසුගිය පොදු සමා කාලයන්ට ඇතුළත් නොකිරීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 නොවැම්බර් 04 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2208/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) අධිකරණ නිලධාරින්ගේ සහ වෙනත් නිලධාරින්ගේ පුරප්පාඩු සංඛ්‍යාව ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2250/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් සීනි කර්මාන්ත ශාලා සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම කර්මාන්ත ශාලාවල සීනි නිෂ්පාදනය වාර්ෂිකවල එක් එක් කර්මාන්ත ශාලාව අනුව වෙන් වෙන් වශයෙන් කොමණද;

(iii) එම කර්මාන්ත ශාලාවලට උක් සපයන ගොවීන් සංඛ්‍යාව කර්මාන්ත ශාලාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම කර්මාන්ත ශාලා තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2295/2026

ගරු සුරංග රත්නායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් නොමැති හෝ විවිධ හේතු මත සාමාන්‍ය යතුරුපැදි භාවිතා කළ නොහැකි ඇතැම් පුද්ගලයන් විසින් 48cc ධාරිතාවයෙන් යුත් යතුරුපැදි භාවිතා කරන බව දන්නේද;

(ii) පොලිස් නිලධාරින් විසින් එම යතුරුපැදි ධාවනය කරන පුද්ගලයන්ගෙන් රියදුරු බලපත්‍ර ඉල්ලා සිටීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මඟින් අපහසුතාවයට පත් වන බව දන්නේද;

(iii) මේ වනවිට පවතින නීතිය අනුව 48cc ධාරිතාවයෙන් යුත් යතුරුපැදියක් ධාවනය කිරීම සඳහා රියදුරු බලපත්‍රයක් අනිවාර්ය වන්නේද;

(iv) එසේ නම්, එම යතුරුපැදි භාවිතා කරන ගොවීන්, වැඩිහිටියන් සහ අඩු ආදායම්ලාභී පුද්ගලයන් සඳහා සහනදායි නීතිමය හෝ පරිපාලන ක්‍රමවේදයක් හඳුන්වාදීමට රජයේ අවධානය යොමුවී තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2299/2026

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ලියාපදිංචි කර ඇති, එන්ජින් ධාරිතාව ඝන සෙන්ටිමීටර 50ට (50cc) අඩු මෝටර් සයිකල් සහ මොපෙඩ් (Moped) සංඛ්‍යාව කොපමණද;

(ii) එම මෝටර් සයිකල් සහ මොපෙඩ් ලියාපදිංචි කිරීම සඳහා වර්තමානයේ පවතින ක්‍රමවේදය කවරේද;

(iii) එන්ජින් ධාරිතාව 50cc ට අඩු මෝටර් සයිකල් ලියාපදිංචි කිරීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි, ඉදිරිපත් කළ යුතු ලේඛන සහ තාක්ෂණික අවශ්‍යතා කවරේද;

(iv) 2010 වර්ෂයට පෙර මිලදී ගන්නා ලද, එන්ජින් ධාරිතාව 50cc ට අඩු මෝටර් සයිකල් සහ මොපෙඩ් ලියාපදිංචි කිරීම සඳහා සහනදායි ක්‍රමවේදයක් හෝ විශේෂ සහන කාලයක් ලබාදීම කෙරෙහි අවධානය යොමුවී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2457/2026

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දිනකට අපේක්ෂිත දුම්රිය ගමන් වාර සංඛ්‍යාව සහ මේ වනවිට දිනකට ධාවනය වන සැබෑ දුම්රිය ගමන් වාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සමස්ත දුම්රිය ගමන් වාර ආවරණය කිරීම සඳහා අවශ්‍ය වන දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතුව පවතින මුළු දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල සංඛ්‍යාව කොපමණද;

(iv) එම එන්ජින් සහ බලවේග කට්ටල අතරින් මේ වනවිට සක්‍රිය ධාවන තත්ත්වයේ පවතින ප්‍රමාණය කොපමණද;

(v) තාවකාලිකව ධාවනයෙන් ඉවත් කර ඇති, එහෙත් නැවත ධාවන තත්ත්වයට පත් කළ හැකි මට්ටමේ පවතින දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල සංඛ්‍යාව කොපමණද;

(vi) අක්‍රිය මට්ටමේ පවතින එම දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල නැවත ධාවනයට එක් කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vii) එම ක්‍රියාමාර්ගවල වත්මන් ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?